# බුදු සිරිතේ පළමු වසර

බෝධිසත්වයන් වහන්සේ
ඇසතු බෝ රුකමුල
බුද්ධත්වය ලැබූ පසු පළමු
වසර තුළ සිදු වූ සුවිශේෂී
සිදුවීම් මෙම පාඩමට
ඇතුළත් ය.

# සත් සතිය

බුද්ධත්වය ලැබිමෙන් පසු බුදුන් වහන්සේ සති හතක් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ඇසුරු කරමින් ගත කළහ. එය සත් සතිය වේ.



# පළමු සතිය

- මෙම සතියේදි බුදුන් වහන්සේ ඇසතු බෝ රුක මුල වැඩ සිටිමින් පටිච්ච සමුප්පාදය අනුලෝම පටිලෝම වශයෙන් හා පටිලෝම අනුලෝම වශයෙන් මෙනෙහි කිරීම

- දෙවියන්ගේ සැකදුරු කිරීම පිණිස යමක මහා ප්‍රාතිහාර්ය පෑම



# දෙවන සතිය

බුදුන් වහන්සේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට ඊසාන දෙසින් වැඩ සිටිමින් අනිමිස ලෝචන පූජාව පැවැත්වීම හෙවත් බෝධීන් වහන්සේ දෙස සතියක් ඇසිපිය නොහෙලා

බලා සිටිමින් බෝධීන් වහන්සේට කළගුණ ±ක්වීම.


තෙවන සතිය

බෝධි මූලය හා අනිමිස
ලෝචන පූජාව සිදු කළ
ස්ථානය අතර සක්මන් කිරීම
මෙම
සතියේ § සිදු කලහ. එය
රැවන් සක්මන ලෙස හඳුන්වයි.


සිව්වන සතිය

මෙම සතියේ§ බුදු රජාණන් වහන්සේ බෝධීන් වහන්සේට වයඹ දෙසින් පිහිටි රුවන් ගෙයි වැඩ සිටිමින් අභිධර්මය මෙනෙහි කිරීම සිදු විය. මෙහිදි බුද්ධ ශරීරයෙන් බුදුරැස් විහිදෙන්නට විය.


පස්වන සතිය

- ❖මෙම සතියේ§ බුදු රජාණන් වහන්සේ අජපාල නුගරුක මුල වැඩ සිටියහ. එහිදි හුහුංක ජාතික බමුණෙකු පැමිණි අතර ඔහුට සැබෑ බමණෙකුගේ ලක්ෂණ කියා දුන්හ.
- ❖මාර දිව්‍ය පුත්‍රයාගේ පැමිණීම
- ❖මාර දූ වරුන්ගේ පැමිණීම
- ❖තමන් වහන්සේට ගුරුවරයෙක් නොමැති නිසා ධර්මය ගුරු තැන්හිලා සලකන්නට බුදු රජාණන් වහන්සේ තීරණය කිරිම

සයවන සතිය



මෙම සතියේ බුදු රජාණන් වහන්සේ මිදෙල්ල ගස මුල වැඩ සිටියහ. එහි මහා වර්ෂාවක් පැමිණි අතර බුදුන් වහන්සේ ආරක්ෂා කිරීමට මුචලින්ද නා රජු ඉදිරිපත් විය.



සත්වන සතිය

මෙම සතියේ§ බුදු රජාණන් වහන්සේ කිරිපඩු රැක මුල සමාපත්ති සුවයෙන් වැඩ සිටීම සිදු විය.


සත් සතිය ගත කිරීමෙන් පසු
බුදුරජාණන් වහන්සේ කිරිපඩු රැකමුල
වැඩ සිටින විට තපස්සු හල්ලුක
වෙළඳ දෙබෑයන් පැමිණ අත්සුණු හා
මීපිඩු පූජා කළහ. දහම් සරණ ගිය
පළමු දේවාචික
උපාසකවරුන් තපස්සු හල්ලුක විය.



සහම්පතී මහා බ්‍රහ්මයා බුදු රජාණන් වහන්සේ වෙත පැමිණ ලෝකයාට ධර්මය දේශනා කිරීමට ආරාධනා කිරීම.



- බුදුන් වහන්සේට පළමු ධර්ම දේශනය කළ යුත්තේ කාට±යි විමසා බැලීමේ ආලාර කාලාම හා උද්දකරාමපුත්ත සිහිපත් විය. නමුත් ඒ වන විට ඔවුන් මිය ගිය සිටි නිසා තමන් වහන්සේ දුෂ්කර ක්‍රියා කරන කාලයේ උපස්ථාන කළ පස්වග තවුසන්ට ධර්මය දේශනා කළහ.

පස්වග මහණුන්ට ධර්මය දේශනා කිරීමට සිතා බුදුන් වහන්සේ බරණැස ඉසිපතනයට වඩින අතරමඟදි උපක ආජීවකයා හමුවිය. ඔහු බුදුන් වහන්සේගෙන් විමසා සිටියේ ඔබේ ශාස්තෲවරයා කවරෙක්ද ? ඔබ රැචිකරන ධර්මය කුමක්ද? යන්න විමසීය. එහිදි බුදුන් වහන්සේගේ පිළිතුර වූයේ සියල්ල අවබෝධ කළ සියල්ලේ නොඇලී නිවන් පසක් කළ මට ගුරුවරයෙකු නැති බවයි. පසුව උපක ආජීවකයා ඔබ අනන්ත ජින යයි බුදුන් වහන්සේගෙන් විමසූ විට සිය¨ කෙලෙස් නසා නිවන් පසක් කළ තමා ජින ලෙස හැඳින්විය හැකි බවද පැවසීය.

# පස්වග මහණුන්

- කොණ්ඩඤ්ඤ
- වප්ප
- හද්දිය
- මහානාම
- අස්සජි



බුදුන් වහන්සේ දේශණා කළ පළමු සූත්‍රය
දම්සක් පැවතුම් සූත්‍රය යි.
මෙම සුත්‍රය අසා පළමුව
කොණ්ඩඤ්ඤ තවුසාද පසුව අනෙක් සිව්
දෙනාද සෝවාන් වූ අතර ඒහි භික්ෂු
භාවයෙන් පැවිදි විය.
පසුව බුදුන් වහන්සේ අනත්ත ලක්ඛන
සුත්‍රය දේශණා කළ අතර එය අසා පස්වග
මහණුන් රහත්විය.



යසකුල පුත්‍රයා බුදුන් වහන්සේ වෙත පැමිණ ධර්මය අසා සෝවාන් විය.

# බරණැස් සිටුතුමා තම පුතු වු යසකුල පුත්‍රයා සොයා බුදුන් වහන්සේ වෙත පැමිණ ධර්මය අසා සෝවාන් වියි

පසුදින බුදුන් වහන්සේ බරණැස් සිටුතුමාගේ නිවසේ දහවල දානයට වැඩම කළ අතර බුදුන් වහන්සේ දේශනා කළ ධර්මය අසා යස මහ රහතන් වහන්සේගේ ගිහි කළ බිරිඳ හා මව සෝවාන් විය. තෙරුවන් සරණ ගිය පළමු උපාසිකාවන් වන්නේ ඔවුන් ය.



# පළමු රහත් හැට නම

පස්වග මහණුන්

යසකුල පුත්‍රයා

විමල සුබාහු
පුණ්ණජි ගවම්පති

යහළුවන් පනස් දෙනා



# බුදු සසුනේ භික්ෂු පිරිස වර්ධනය වු ආකාරය

පළමු රහත් හැට නම

↓

භද්දවග්ගිය කුමාරවරු තිස්දෙනා

↓


ජටිල සහෝදරයන්

උරුවේල කාශ්‍යපගේ පිරිස පන්සියයි

නදී කාශ්‍යපගේ පිරිස තුන්සියයයි

ගයා කාශ්‍යපගේ පිරිස දෙසීයයයි

# ජඨීල දමනය



# බුදුන් වහන්සේගේ පළමු ලංකාගමනය

- ❖ බුදුන් වහන්සේගේ පළමු ලංකාගමනය සිදු වූයේ මහියංගනයට ය.
- ❖ යක්ෂ ගෝත්‍රික දෙපිරිසක් අතර ඇති වු යුද්ධයක් සංසිඳුවා ධර්මය දේශණා කිරීම මෙහි§ සිදුවිය.
- ❖ මෙහි§ සුමන සමන් දෙවියන් ධර්මය අසා සෝවාන් විය.
- ❖ සුමන සමන් දෙවියන් පිදිමට යමක් ඉල්ලූ නිසා බුදුන් වහන්සේ හිස පිරිමැද කේශධාතු මිටක් ලබා දුනි.
- ❖ එම ධාතු තැම්පත් කර මහියංගන චෛත්‍යය ඉදි වු බව සඳහන් ය.

# පළමු ලංකා ගමනය



# මහියංගන වෙහෙර




# බිම්බිසාර රජු මුණ ගැසීම

බුදුන් වහන්සේ තම ශ්‍රාවක පිරිස සමඟ මගධයේ රජගහ නුවර සමීපයේ තල් වනයේ වැඩ සිටි බව දැනගත් බිම්බිසාර රජු විශාල පිරිසක් සමඟ එහි පැමිණියේය. එතුමා ධර්මය අසා සෝවාන් විය.



සෝවාන් වු පළමු රජු බිම්බිසාර රජු වේ. පසු දින දානයට ආරාධනා කළ එතුමා වේළුවන උයන බුදුන් වහන්සේට පූජා කරන ලදි.  මෙය බුදු සසුනේ පළමු ආරාම පූජාවයි.



The Buddha subsequently visited Rajagaha city where King Bimbisara came to pay homage to the Buddha and His disciples.

# උපතිස්ස කෝලිත දෙදෙනා පැවිදි වීම

සංජය පිරිවැජියා සමීපයේ සිටි දෙසිය පනහක පිරිසක් සමග උපතිස්ස කෝලිත දෙදෙනා සැරියුත් මුගලන් නමින් බුදු සසුනේ පැවිදි විය. බුදු සසුනේ' අග තනතුරු හිමි වුයේ සැරියුත් මුගලන් තෙරවරුන්ටය.



# බුදුන් වහන්සේ කිඹුල්වතට වැඩම වීම

❖සිදුහත් කුමරු ගිහිගෙය හැර ගියදා පටන් සුදොවුන් රජු රහසිගතව දූතයන් යවමින් සොයා බැලීයි

❖ බුදුන් වහන්සේ රජගහ නුවර වැඩ සිටින බව දැන උන් වහන්"සේ වැඩමවාගෙන ඒ"මට ඇමතියෙකු සමඟ රාජ පුරුෂයන් දහසක් යැවිය.

❖මෙලෙස කණ්ඩායම් නවයක්ම යැවූ අතර ඒ සිය¨ දෙනා බුදු සසුනේ පැවිදි වියි

❖සුදොවුන් රජු කාළුදායි ඇමති ඇතු¨ පිරිසට පැවිදි වීමට අවසරද ලබා දි බුදුන් වහන්සේ කිඹුල්වතට වැඩමවා ගෙන ඒමට පිටත් කර යැවීය.

විසි දහසක් රහතන් වහන්සේලා පිරිවරාගෙන බුදුන් වහන්සේ මැදින් පුර පසළොස්වක පොහෝදා රජගහ නුවරින් පිටත්ව වෙසක් පුර පසළොස්වක පොහෝදා කිඹුල්වත්පුරයට ලගා විය.

